(ඒ) සේවා නියුක්තිය සහ කම්කරු සම්බන්ධතා

1 හැඳින්වීම

සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය පිළිබඳව සංඛ්‍යා එක්රැස් කරනුයේ ක්‍රමවත් පදනමක් මත නොවේ. 1971 සංගණනයේ දත්තයන් ලබා ගත හැකිව ඇති මුත්, අදළ සංඛ්‍යා විශ්ලේෂණය සඳහා ලැබෙන විට සෑහෙන කාලයක් ගතවනු ඇත. 1969 11-1 සිට ආරම්භව මාස දෙකක කාලසීමාවක් ආවරණය වන පරිදි සමාජයීය ආර්ථික සම්ක්ෂණයක් සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලදී. එකී සම්ක්ෂණයේ ප්‍රතිඵල අනුව 5,57,000 පුද්ගලයන් සේවා වියුක්තව සිටි අතර, 35,18,000 පුද්ගලයන් සේවා නියුක්තව සිටින ලදී. ඒ අනුව සේවක පිරිසෙන් සියයට 14 ක් සේවා වියුක්ත වූවන් වී ඇත.

මාසික පදනමක් මත යම් අනුකූලතාවයන් ඇතිව ලබා ගත හැකි සංඛ්‍යාවන් නම්, රැකියා හෝ වඩා යහපත් රැකියා බලාපොරොත්තුවෙන් දිවයිනෙහි රැකීරක්ෂා කාර්යාලවල ලියාපදිංචි වූවන්ගේ සංඛ්‍යාවය. සේවා නියුක්ත වූවන්ගේ සංඛ්‍යාවන් සම්බන්ධයෙන් මෙම ඇස්තමේන්තු අසම්පූර්ණ ය. කෙසේ වෙතත්, මේවායින් උපනතින් පුළුල් වශයෙන් පෙන්වයි.

මෙම සංඛ්‍යාවන් පරිපූරණය කිරීම සඳහා රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව වාර්ෂික විමර්ශණයක් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වනු ලැබේ. තවද සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ.) යටතේ ලියාපදිංචි වී ඇති සේවකයන් සම්බන්ධයෙන් ද මහ බැංකුව විස්තර ලබා ගනී. මෙසේ ලබාගත් අළුත්ම දත්තයන් ඇත්තේ, 1971 වර්ෂය සඳහාය. සේ.අ අ. බාහිරව අනුමත කළ පෞද්ගලික අර්ථසාධක අරමුදල් (අ.පෞ අ.අ) කීපයක්ම තිබෙන බැවින් එකී සංඛ්‍යාවන් පරිපූරණ ඒවා නොවේ. එම අනුමත කළ පෞද්ගලික අර්ථසාධක අරමුදල් වලින් ඒවාට අදළ සේවා නියුක්ති සංඛ්‍යාවන් ඉල්ලීමෙන්, සංඛ්‍යාවල පරිපූර්ණ භාවයක් ඇති කිරීමට උත්සාහයක් දරා ඇත

2. රැකීරක්ෂා කාර්යාල මගින් රැකියා ලබා දෙනු ලැබූ සංඛ්‍යාව

1960 සිට 1972 දක්වා රැකීරක්ෂා කාර්යාල මගින් වාර්ෂික වශයෙන් රැකියා ලබා දුන් අයගේ සංඛ්‍යාව II (ඒ) 1 වැනි සංඛ්‍යා සටහනේ දක්වේ. 1972 වර්ෂයේදී රැකීරක්ෂා කාර්යාල මගින් රැකියාවන් ලබා දෙනු ලැබූ පුද්ගලයින්ගේ මුළු සංඛ්‍යාව 3,293 කි රැකීරක්ෂා කාර්යාල විසින් සියලුම වර්ගවලට (අර්ධ පුහුණු ගණයේ හැර) අයත් සේවකයන් සඳහා රැකියා ලබා දුන් අයගේ සංඛ්‍යාව ඉකුත් වර්ෂය හා සසඳන කළ අඩු වී ඇතිමුත් රැකියා ලබා දුන් මුළු සංඛ්‍යාව සියයට 8 කින් අඩු විය.

II (ඒ) 1 වන සංඛ්‍යා සටහන

රැකියා ලබා දෙනු ලැබූ පුද්ගලයින්ගේ සංඛ්‍යාව සහ එක් එක් වර්ග යටතේ, ලියාපදිංචි වී ඇති මුළු සංඛ්‍යාවට එහි ඇති සාපේක්ෂ වැදගත්කම

වර්ෂය	කාර්මික සහ ලිපිකරු		පුහුණු		අර්ධ - පුහුණු		නුපුහුණු		එකතුව	
	සේවා ලබාදුන් සේවායෝජක සංඛ්‍යාව	වර්ෂය යටතේ ලියාපදිංචි වූවන්ගේ මුළු ගණනින් සියයට ගණනය	සේවා ලබාදුන් සේවායෝජක සංඛ්‍යාව	වර්ෂය යටතේ ලියාපදිංචි වූවන්ගේ මුළු ගණනින් සියයට ගණනය	සේවා ලබාදුන් සේවායෝජක සංඛ්‍යාව	වර්ෂය යටතේ ලියාපදිංචි වූවන්ගේ මුළු ගණනින් සියයට ගණනය	සේවා ලබාදුන් සේවායෝජක සංඛ්‍යාව	වර්ෂය යටතේ ලියාපදිංචි වූවන්ගේ මුළු ගණනින් සියයට ගණනය	සේවා ලබාදුන් සේවායෝජක සංඛ්‍යාව	ලියාපදිංචි වූවන්ගේ මුළු ගණනින් සියයට ගණනය
1960	1,400	5·3	771	4·6	1,247	3·6	4,744	6·5	8,162	5·4
1961	1,259	4·6	631	3·5	964	2·8	2,794	3·9	5,648	3·7
1962	1,263	3·7	468	2·7	809	2·3	2,315	3·5	4,857	3·2
1963	1,322	3·7	502	3·0	836	2·3	2,466	3·9	5,129	3·4
1964	1,722	4·4	535	3·2	945	2·5	3,599	5·5	6,801	4·3
1965	1,495	2·7	846	4·2	1,035	2·1	3,753	5·0	7,129	3·6
1966	1,056	1·6	740	3·4	917	1·5	4,089	4·5	6,802	2·9
1967	1,018	1·4	588	2·5	712	1·1	1,938	2.1	4,254	1·7
1968	680	0·9	780	3·1	794	1·1	2,696	2·6	4,950	1·8
1969	865	1·0	710	2·3	800	0·9	2,908	2·1	5,283	1·5
1970	526	0·5	584	1·5	428	0.4	1,287	0·7	2,825	0·7
1971	640	0·6	778	1·8	462	0·5	1,701	0·9	3,581	0·8
1972	612	0·7	529	1 2	656	0·6	1,496	0 7	3,293	0 7

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව.

3. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය

අර්ධ රාජ්‍ය ආයතනවල (රාජ්‍ය සංස්ථා, විශ්ව විද්‍යාල, මණ්ඩල යනාදි පර්යේෂණ ආයතන) සේවා නියුක්තිය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වනු ලැබූ සමීක්ෂණයට ලැබුණු අනුකූලතාවය සතුටුදායක විය. රාජ්‍ය සේවාවේ සේවා නියුක්තිය පිළිබඳව පැවැත් වූ එවැනි ම පරීක්ෂණයකට රජයේ දෙපාර්තමේන්තුවලින් ලැබුණු අනුකූලතාවය තරමක් සතුටුදායක විය. එසේ පරීක්ෂණයට අනුකූලතාවය නොදැක් වූ දෙපාර්තමේන්තු පිළිබඳ සංඛ්‍යා ලබාගත්තේ 1970/71 සහ 1971/72 රජයේ ආදයම් හා වියදම් ඇස්තමේන්තුවලිනි. අවශ්‍යයෙන්ම ඒ අනුව සේවාවෙහි නියුතුව සිටි නියම සංඛ්‍යාව නොව, අනුමත කළ සේවක සංඛ්‍යාව පිළිබිඹු විය හැකිය.

ගණය සහ සේවා තත්ත්වය අනුව (ස්ථිර, තාවකාලික සහ අනියම්) සේවකයන් වර්ග කොට ඇත. සැලකිල්ලට භාජනය වූ ගණ නම්,

1. මාණ්ඩලික තත්ත්වයේ පරිපාලන, කාර්මික සහ වෘත්තීය නිලධාරීන්;
2. සහායක සේවකයන්;
3. සුළු සේවකයන්;
4. පාසල් ගුරුවරුන් (රාජ්‍ය දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් නම්)
5. අනෙකුත්.

(අ) රජයේ දෙපාර්තමේන්තු

1971 සහ 1972 සඳහා රජයේ දෙපාර්තමේන්තුවල සේවා නියුක්ති ඇස්තමේන්තු II (ඒ) 2 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත. මෙම සංඛ්‍යා සටහනෙහි දක්වෙන පරිදි රජයේ දෙපාර්තමේන්තුවල සේවා නියුක්ති සංඛ්‍යා තොරතුරුවලට රජයේ පාසල් ගුරුවරුන් ද ඇතුළත් වී ඇත. 1971 සහ 1972 යන වර්ෂ දෙකෙහි ම රජයේ පාසල් ගුරුවරුන් මුළු ගණනින් සියයට 29 ක් ගණනය කරන ලදී. 1972 දී මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 58 ක් පමණ සහායක සහ සුළු සේවක ශ්‍රේණි වල වී ඇත මින් මුළු සංඛ්‍යාවෙන් සහායක සේවකයන් සියයට 32 ක් ද. සුළු සේවකයන් සියයට 26 ක් ද ගණනය විය. විවිධ ගණයන් අතර සේවකයන් බෙදී ගිය රටාව, දළ වශයෙන් 1971 පැවති අන්දමට සමාන විය. මුළු සංඛ්‍යාවෙන් සියයට 26 ක් සමන්විත වූයේ මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන් ය.

මුළු සංඛ්‍යාවෙන්, ස්ථිර සේවකයන්ගේ කොටස අවුරුදු දෙකෙහි දී ම සියයට 87 ක් ව නොවෙනස්ව පැවතිනි. තාවකාලික ශ්‍රේණිවල සිටින්නන්ගේ සංඛ්‍යාව 1971 දී වූ සියයට 5.1 සිට 1972 දී සියයට 5.8 දක්වා ඉහළ ගොස් ඇත. එසේ වුවද, අනියම් සේවකයන්ගේ සංඛ්‍යාව 1971 දී වූ සියයට 13 සිට 1972 දී වූ සියයට 6 දක්වා අඩු වී ඇත.

1972 දී රජයේ දෙපාර්තමේන්තුවල මුළු සේවක සංඛ්‍යාව සියයට 6.7 කින් වැඩි විය. 1971 වසරට වඩා සියයට 10.6 කින් සහායක ශ්‍රේණිවල නිලධාරීන්ගේ සංඛ්‍යාවේ වූ වැඩිවීම ඉහළම වැඩිවීම වෙයි. පරිපාලන ශ්‍රේණීන්, පාසල් ගුරුවරුන් සහ සුළු සේවකයන්ගේ සංඛ්‍යා පිළිවෙලින් සියයට 9·6 ක, සියයට 2.9 ක සහ සියයට 6.9 ක වැඩිවීමක් වාර්තා කරන ලදී.

(ආ) අර්ධ-රාජ්‍ය ආයතන

අර්ධ රාජ්‍ය ආයතනවල සේවා නියුක්ති සංඛ්‍යාවේ ඇස්තමේන්තු පහත දක්වෙන II (ඒ) 3 සංඛ්‍යා සටහනෙන් දැක්වේ :—

II (ඒ) 2 වන සංඛ්‍යා සටහන

සේවා නියුක්ති සංඛ්‍යාව - රජයේ දෙපාර්තමේන්තු

	සේවා තත්වය සහ සේවක සංඛ්‍යාව								1971 අනුව වෙනසෙහි සියයට ගණන
	ස්ථිර		තාවකාලික		අනියම		එකතුව		
	1971 දෙ. 31 දිනට	1972 දෙ. 31 දිනට	1971 දෙ 31 දිනට	1972 දෙ. 31 දිනට	1971 දෙ. 31 දිනට	1972 දෙ. 31 දිනට	1971 දෙ. 31 දිනට	1972 දෙ. 31 දිනට	
1. මාණ්ඩලික ශ්‍රේණියේ පරිපාලන, කාර්මික සහ වෘත්තීය නිලධාරීන් ..	9,915	10,858	568	620	8	17	10,491	11,495	+ 9·6
2. සහාය සේවකයන් ..	99,500	108,500	1,700	2,560	1,850	2,954	103,050	114,014	+ 10·6
3. යුළු සේවකයන් ..	52,670	58,250	13,725	16,257	20,125	17,994	86,520	92,501	+ 6·9
4. පාසැල් ගුරුවරුන් ..	97,854	100,724	—	—	—	—	97,864	100,724	+ 2·9
5. අනෙකුත් .	28,944	29,956	852	936	942	1,053	30,738	31,94	+ 3·9
එකතුව ..	288,893	308,288	16,845	20,373	22,925	22,018	328,663	350,679	+ 6·7

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සංලක්ෂය:

1. (i) ව්‍යවස්ථාදායක නිලධාරීහු සහ රජයේ පරිපාලකයෝ
   (ii) කළමනාකාර, සභාපති සහ අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීහු
   (iii) විද්‍යාඥයෝ, කාර්මිකයෝ සහ ඉංජිනේරුවෝ, වෛද්‍යවරු, මහාචාර්යවරු සහ කථිකාචාර්යවරු ගණකාධිකාරීවරු, නක්සේරු කරුවෝ.
2. (i) ලිපිකරු ශ්‍රේණි.
   (ii) සරප්වරු.
   (iii) ලඝුලේඛකයෝ, යතුරු ලේඛකයෝ, සටිපර් ක්‍රියා කරවන්නෝ.
   (iv) දුරකථන සේවකයෝ සහ කාර්යාල යන්ත්‍ර ක්‍රියා කරවන්නෝ.
   (v) පරිවර්තකයෝ.
   (vi) ව්‍යාප්ති පරීක්ෂණ සහ විමර්ශන සේවකයෝ.
   (vii) පොලිස් නිලධාරීහු සහ ග්‍රාම සේවකයෝ.
   (viii) ගබඩාකරුවෝ.
3. (i) පණිවුඩකරුවෝ.
   (ii) කාර්යාල කාර්ය සහායකයෝ.
   (iii) උපස්ථායක සහ ඕඩර්ලිවරු.
   (iv) රියදුරු (මෝටර් රථ, ලොරි ආදිය)
   (v) නුපුහුණු කම්කරුවෝ.
   (vi) අර්ධ - පුහුණු කම්කරුවෝ.
   (vii) පුහුණු කම්කරුවෝ.
4. (i) විදුහල්පතිවරු, උපවිදුහල්පතිවරු, මුල්ගුරුවරු සහ සහකාර මුල්ගුරුවරු.
   (ii) පුහුණු, සහතිකලත්, ඉංග්‍රීසි සහතිකලත්, වැනි වෘත්තීය සුදුසුකම් ලත් ගුරුවරු.
   (iii) උපාධිධාරී සහ අන්තර් කලා ගුරුවරු.
   (iv) වෘත්තීය සුදුසුකම් නොලත්, අර්ධ කාලීන සහ අනියම් ගුරුවරු සහ ගුරු ශිෂ්‍ය හා ශිෂ්‍ය ගුරුවරු

II (ඒ) 3 වැනි සංඛ්‍යා සටහන

සේවා නියුක්ති සංඛ්‍යා - අර්ධ-රාජ්‍ය ආයතන

	සේවා තත්වය හා සේවක සංඛ්‍යාව								1972/71
	ස්ථිර		තාවකාලික		අනියම්		එකතුව		
	1971 දෙ. 31 දිනට	1972 දෙ. 31 දිනට	1971 දෙ. 31 දිනට	1972 දෙ. 31 දිනට	1971 දෙ. 31 දිනට	1972 දෙ. 31 දිනට	1971 දෙ. 31 දිනට	1972 දෙ. 31 දිනට	වෙන සෙහි ප්‍රතිශතය
1. *පරිපාලන, ශිල්පීය සහ මාණ්ඩලික ශ්‍රේණියේ වෘත්තීය නිලධාරීන් ..	11,796	13,539	325	578	241	220	12,362	14,337	+ 16·0
2 **සහාය සේවකයින් ..	23,307	25,806	728	722	884	477	24,919	27,005	+ 8·4
3. †සුලු සේවකයින් ..	57,129	73,974	9,345	9,497	18,678	19,156	85,152	102,627	+ 20·5
4. අනෙකුත් ..	50,237	51,170	793	961	1,897	2,153	52,927	54,284	+ 2·6
එකතුව ..	142,469	164,489	11,191	11,758	21,700	22,006	175,360	198,253	+ 13·1

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සංලක්ෂය:

1.* (i) ව්‍යවස්ථාදායක නිලධාරිහු හා රජයේ පරිපාලකයෝ.
(ii) කළමනාකාර, සභාපති සහ අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීහු.
(iii) විද්‍යාඥයෝ, කාර්මිකයෝ සහ ඉංජිනේරුවෝ, වෛද්‍යවරු, මහාචාර්යවරු සහ කථිකාචාර්යවරු,

2.** (i) ලිපිකරු ශ්‍රේණි.
(ii) සරප්වරු
(iii) ලඝු ලේඛකයෝ යතුරු ලේඛකයෝ සහ සයිපර් ක්‍රියා කරවන්නෝ.
(iv) දුරකථන සේවකයෝ සහ කාර්යාල යන්ත්‍ර-ක්‍රියා කරවන්නෝ.
(v) පරිවර්තකයෝ.
(vi) ව්‍යාජති පරීක්ෂකයෝ හා විමර්ශන නිලධාරිහු.
(vii) පොලිස් නිලධාරිහු සහ ග්‍රාම සේවකයෝ.
(viii) ගබඩා භාරකරුවෝ.

3.† (i) පණිවුඩකරුවෝ.
(ii) කාර්යාල කාර්ය සහායකයෝ.
(iii) උපස්ථායක හා ඔඩර්ලිවරු
(iv) රියැදුරු (මෝටර් රථ හා ලොරි ආදිය).
(v) නුපුහුණු කම්කරුවෝ.
(vi) අර්ධ පුහුණු කම්කරුවෝ.
(vii) පුහුණු කම්කරුවෝ.

1972 දී අර්ධ රාජ්‍ය ආයතනවල රැකියා දෙනු ලැබූ අයගේ අනුපාතය වැඩි විය. මුළු සේවක සංඛ්‍යාවේ වැඩිවීම 1972 හා 1971 දී පිළිවෙලින් සියයට 13.1 සහ සියයට 3.3 ක් විය. ප්‍රසාරණ අනුපාතයන්හි මෙකී වැඩිවීම ප්‍රධාන වශයෙන් ම පිළිබිඹු වූයේ, පරිපාලන නිලධාරී සහ සුළු සේවක ගණයන්හි වන අතර, එම අනුපාතයන් පිළිවෙලින් සියයට 16·0 ක් සහ 20·5 ක් විය. 1971 දී වූ සමානුරූප අනුපාතයන් පිළිවෙලින් සියයට 9·4 ක් සහ –2.4 ක් විය. සහාය සේවකයින්ගේ ගණයේ ප්‍රසාරණ අනුපාතිකය 1972 සහ 1971 දී දළ වශයෙන් එසේම පැවතිනි.

1972 දී, අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවකයින්ගෙන් සියයට 52 ක් පමණ සුළු සේවක ගණයෙහි විය. 1971 දී අනුරූප සංඛ්‍යාව 49 ක් විය. 1972 දී සහාය සේවකයන්ගේ සහ පරිපාලන නිලධාරීන්ගේ සමානුපාතයන් දළ වශයෙන් එසේ ම පැවතිනි.

1972 දී මුළු සේවක සංඛ්‍යාවෙන් ස්ථිර ගණයන්හි වූයේ සියයට 83 ක් පමණ වන අතර, 1971 දී අනුරූප ප්‍රතිශතය සියයට 81 ක් පමණ විය. 1972 අනියම් සේවකයන් සියයට 11 ක් පමණ ගණනය කර ඇති අතර, 1971 දී අනුරූප ප්‍රතිශතය සියයට 12 ක් පමණ විය. 1972 සහ 1971 යන වර්ෂ දෙකේදී ම තාවකාලික සේවක සංඛ්‍යාව මුළු සංඛ්‍යාවෙන් සියයට 6 ක් පමණ ගණනය කරන ලදී.

4. (අ) සේවක අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි වී ඇති සේවකයන්

සේවක අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි වූවන් සම්බන්ධයෙන් අළුත්ම තොරතුරු ලබා ගැනීමට ඇත්තේ 1971 සඳහා ය. 1970 දී 23,159 ක් වූ සේවා ස්ථාන සංඛ්‍යාව හා සසඳන කළ 1971 දී සේවා ස්ථාන 34,460 ක් සේ.අ. අරමුදලට දායක වෙමින් තිබිණි. මෙය සියයට 49 ක වැඩිවීමකි. මෙම වැඩිවීමට තරමක් දුරට හේතු වී ඇත්තේ, සේ. අ.අරමුදලේ විෂය පථය සියළු ම සේවායන් ඇතුළත් වන පරිදි පුළුල් කිරීමය. සේවකයන් තිදෙනෙකුට අඩුවෙන් යොදවා ගණු ලැබූ ව්‍යාපාර ආයතන ඉහත දී, සේ. අ. අරමුදලට දායක වීමෙන් නිදහස් කොට තිබිණි. පෞද්ගලික ආයතනයන්හි සේවායනට අමතර වශයෙන්, වරාය සංයුක්ත මණ්ඩලය සහ සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව වැනි සමහරක් විශාල සංස්ථාවන්ද සේ.අ.අ. මගින් ආවරණිත වෙයි. සේ.අ.අ හි ලියාපදිංචි වී ඇති සේවකයන්, ප්‍රධාන කාර්මික ගණ අනුව II (ඒ) 4 දරන සංඛ්‍යා සටහනෙහි වර්ග කර ඇත.

II (ඒ) 4 වන සංඛ්‍යා සටහන

සේවක අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි වී ඇති සේවක සංඛ්‍යාව

කර්මාන්තය	වර්ෂාවසානය වනවිට ලියාපදිංචි වී සිටි සංඛ්‍යාව				
	1967	1968	1969	1970	1971
1. අපනයන කෘෂිකර්මය ..	1,191,585	1,246,138	1,220,989	1,253,979	1,284,265
2. අනෙකුත් කෘෂිකර්මය ..	3,734	4,743	6,415	5,100	7,455
3. පතල් සහ කැනීම් ..	2,903	2,968	3,351	3,035	3,839
4. නිෂ්පාදන කටයුතු ..	160,839	174·187	206,194	222,955	264,007
5. තැනීම් කටයුතු ..	18,929	24,890	19,745	21,462	22,224
6. වෙළෙඳ සහ ගමනාගමන ..	163,574	176,502	186,733	198,196	236,530
7. සේවා කටයුතු ..	92,458	99,452	105,794	115,161	125,086
8. වර්ග නොකළ* ..	18,930	11,388	4,719	8,575	13,813
එකතුව ..	1,652,952	1,740,268	1,753,940	1,828,445	1,957,239

* දෝෂ සහ අත්හැරීම් ඇතුළත්ය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

සංලක්ෂ්‍ය:

1. සේවායෙන් ඉවත් වූවද තවදුරටත් සේවක අර්ථසාධක අරමුදලේ බැර ශේෂයන් පවත්වාගෙන යනු ලබන සේවකයින්.

2. දැනට වෙනත් කිසිදු සවිස්තරාත්මක තොරතුරු නොමැතිකම නිසා, ආයතනයේ ස්වභාවය අනුව එම ආයතනය අයත්වන කර්මාන්තය වර්ග කර ඇත. එහෙත් බොහෝ අවස්ථාවන්හිදී මෙමගින් කර්මාන්තයේ නියම ස්වභාවය නිරූපණය නොවීම නිසා, උපයෝගී නියම ස්වභාවය හෙළිවන්නේ නොවේ. එබැවින් මෙය දළ වර්ග කිරීමක් පමණක් වෙයි.

සේ.අ. අරමුදලෙහි 1971 ලියාපදිංචි වී සිටි මුළු ගණනින් සියයට 66 ක් කෘෂිකර්මයෙහි ද සියයට 13 ක් නිමැවුම් කර්මාන්තයෙහි ද සියයට 12 ක් වෙළෙඳ හා ප්‍රවාහනයෙහි ද විය. ප්‍රධාන කාර්මික ගණයන්හි බෙදී යෑම රටාව අවශ්‍යයෙන් ම ඉකුත් වර්ෂවලදී මෙන් විය.

සේ.අ.අ. හි ලියාපදිංචි වූ සේවකයන්ගේ මුළු සංඛ්‍යාව 1970 දී මුළු සංඛ්‍යාවෙන් 1971 දී සියයට 7.0 කින් වැඩි විය.

1967/71 කාලඡේදය තුළ ලියාපදිංචි වූ සංඛ්‍යාවෙහි වාර්ෂික සාමාන්‍යය සියයට 4.6 ක් විය. 1971 දී විශාලතම වැඩිවීම සිදුවූයේ අනෙකුත් කෘෂිකාර්මික (සියයට 46 කින්) යෙහි වූ අතර වෙළෙඳ සහ ප්‍රවාහන යෙහි (සියයට 19 කින්) නිමැවුම් කර්මාන්තයේ (සියයට 18 කින්) සහ සේවාවන්හි (සියයට 8 කින්) සැලකිය යුතු වැඩිවීම් සිදු වී ඇත.

කර්මාන්ත සහ දිස්ත්‍රික්ක අනුව සේ.අ.අ. යටතේ ලියාපදිංචි වූ සේවකයන් 1971 දී බෙදී ගිය අයුරු II (ඒ) 5 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

II (ඒ) 5 වන සංඛ්‍යා සටහන

දිස්ත්‍රික්කය හා කර්මාන්තය අනුව, සේ. අ. අ. යටතේ ලියාපදිංචි වූ සේවක සංඛ්‍යාව - 1971

වර්ෂය අවසානයේ සංඛ්‍යා

කර්මාන්ත / දිස්ත්‍රික්කය	කොළඹ	කැගල්ල	මාතර	රත්නපුරය	මහනුවර	නුවර එළිය	කළුතර	යාපනය	පුත්තලම සහ හලාවත	කුරුණෑගල	බදුල්ල	ගාල්ල	වව්නියාව	මාතලේ	අනුරාධපුරය	හම්බන්තොට	ත්‍රිකුණාමලය	මඩකලපුව	පොළොන්නරුව	මන්නාරම	එකතුව
1. අපනයන කෘෂිකර්මය	29,574	106,867	107,680	184,058	263,051	151,471	81,046	250	18,266	45,930	147,758	105,174	—	42,472	—	6	130	532	—	—	1,284,265
2. අනෙකුත් කෘෂිකර්මය	2,131	35	311	548	105	12	209	85	125	22	235	2,206	66	181	291	625	26	143	48	51	7,455
3. පතල් හා කැනීම්	3,591	35	—	1	—	—	59	—	7	40	10	10	—	86	—	—	—	—	—	—	3,839
4. නිෂ්පාදනය	184,899	1,854	4,156	1,186	6,864	1,023	8,568	5,437	15,993	12,252	2,172	8,197	175	2,915	635	592	660	4,721	899	809	264,007
5. තැනීම	12,887	341	104	383	4,015	246	313	737	240	357	1,260	370	20	219	20	21	130	127	442	12	22,244
6. වෙළෙඳාම හා ගම්නාගමනය	140,102	5,875	4,226	5,604	15,547	6,320	8,130	7,080	3,816	9,219	9,403	3,575	1,026	2,470	2,673	1,627	3,061	3,965	2,214	597	236,530
7. සේවා	72,678	1,997	2,753	2,320	7,269	1,705	3,217	2,482	1,015	3,358	3,410	11,694	311	2,037	1,538	775	3,342	2,527	445	211	125,086
8. වර්ග නොකළ	7,715	60	3,010	80	376	93	265	75	707	183	42	276	8	167	—	20	18	456	149	75	13,813
එකතුව	453,577	117,064	122,240	194,188	297,227	160,870	101,807	16,146	40,169	71,361	164,290	131,502	1,606	50,549	5,187	3,666	7,367	12,471	4,197	1,755	1,957,239

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංලක්ෂය: (අ) සේ. අ. අ. යටතේ ලියාපදිංචි කළ සේවකයන්ගේ සංඛ්‍යාව හා සම්බන්ධ සංඛ්‍යාවන්ය.

(ආ) සංඛ්‍යා තාවකාලිකයි

** i සේවාවෙන් ඉවත් වූ නමුත් තවම සේවක අර්ථ සාධක අරමුදලෙහි බැර ශේෂයන් ඇති සේවකයන් හා සම්බන්ධ සංඛ්‍යා ඇතුළත්ය.

ii අනුමත කළ අර්ථ සාධක අරමුදල් ඇති කර්මාන්තයන්හි සේවා නියුක්තිය මේවාට ඇතුළත් නොවේ.

iii කර්මාන්තය අනුව වර්ග කිරීමේ පදනම වූයේ, සේවකයාගේ කර්මාන්තයෙහි ස්වභාවයයි. ලබාගත හැකි වෙනත් තොරතුරක් නොමැති වූ විට ආයතනයෙහි නමින් දක්වුනු පරිදි බොහෝවිට කර්මාන්තයේ නමින් එහි නියම ස්වභාවය හෙළි නොවීය. මේ අනුව බලන කළ මෙය දළ වර්ගීකරණයක් පමණක් වෙයි.

සේවක අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි වී ඇති මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 23 ක් කොළඹ දිස්ත්‍රික්කයෙහි පිහිටි කර්මාන්තවල ද, සියයට 15 ක් මහනුවර ද, සියයට 10 ක් රත්නපුරයේද, සියයට 8 ක් බදුල්ලේ ද විය. දිස්ත්‍රික්ක අනුව ලියා පදිංචි වූවන්ගේ බෙදීයාම රටාව, ඉකුත් වර්ෂවලදී පරිදිම විය. කොළඹ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි සේවකයන්ගේ මුළු ගණනින්, සියයට 41 නිපැයුම් කර්මාන්තවල ද, සියයට 31 ක් වෙළෙඳ සහ ප්‍රවාහනයෙහි ද, සියයට 16 ක් සේවාවන්හි ද විය. අනෙකුත් දිස්ත්‍රික්කවල සේවකයන් බොහෝ දෙනෙක් කෘෂිකාර්මික කටයුතුවල යෙදී ඇත.

(ආ) අනුමතකල පෞද්ගලික අර්ථසාධක අරමුදල්වල සේවකයන් (පෞ. අ. අ.)

මෙකී එක් එක් අරමුදල්වල සිටින සමාජිකයන්ගේ සංඛ්‍යාවන්, ඔවුන්ගේ රැකියා විස්තරත් ඉදිරිපත් කරන ලෙස මෙකී අරමුදල්වලින් වසරතුළ දී මහ බැංකුව විසින් ඉල්ලා යවන ලදී. එයට ලැබුණු අනුග්‍රහය ඉතා සතුටුදායකය. පිළිතුරු නො ලැබුනු අරමුදල් සම්බන්ධයෙන් හුදෙක් ම කම්කරු දෙපාර්තමේන්තුව මගින් එවුන වාර්තා උපයෝගී කර ගැනීමට සිදු විය. පෞ. අ. අ. යටතේ ලියා පදිංචි කළ සේවකයන් පිළිබඳව කර්මාන්ත අනුව වර්ගී කරණයක් 2 (ඒ) 6 වන සංඛ්‍යා සටහනෙහි දැක්වෙයි.

II (ඒ) 6 වැනි සංඛ්‍යා සටහන

අනුමත කළ පෞද්ගලික අර්ථසාධක අරමුදල්වල සාමාජික සංඛ්‍යාව

	1971	1972	සේවයෙහි සියයට ගණන 1972/71
1. අපනයන කෘෂිකර්මය	12,166	11,047	− 9·2
2. අනෙකුත් කෘෂිකර්මය	16	17	+ 6·3
3. පතල් හා කැනීම් .. .	124	153	+23·4
4. නිමැවුම් කර්මාන්තය	21,576	22,071	+ 2·3
5. ගොඩනැගිම්	2,954	2,956	+ 0·1
6. වෙළෙඳ හා ප්‍රවාහන	59,340	59,508	+ 0·3
7. සේවා .. .	22,187	25,923	+16·8
8. වර්ග නොකළ .. .	10,151	8,593	− 15·4
එකතුව	128,514	130,268	+ 1·4

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව, කම්කරු දෙපාර්තමේන්තුව.

අනුමත කළ පෞද්ගලික අර්ථසාධක අරමුදල්වල ලියාපදිංචි වූ සේවක සංඛ්‍යාවට ලංකා ගමනා ගමන මණ්ඩලය හා ලංකා විදුලි බල මණ්ඩලය වැනි ඇතැම් විශාල සංස්ථාවල හා ආයතනවල කාර්ය මණ්ඩලයන් ද ඇතුළත් වෙයි.

1972 දී අනුමත කළ පෞද්ගලික අර්ථසාධක අරමුදල්වල සේවක සංඛ්‍යාව ප්‍රතිශතයක් වශයෙන් 1·4 කින් වැඩි විය. එම වර්ෂයේ දී සේවක සංඛ්‍යාවෙහි විශාලතම වැඩිවීම් වාර්තා වූයේ පතල් හා ගල් කැනීම් (සියයට 23·4 කින්) හා සේවා (සියයට 16·8 කින්) අංශවලය. අපනයන කෘෂිකර්මාන්තයෙහි (සියයට 9·2 ක) හා වර්ග නොකළ රැකියා ගණයේ (සියයට 15·4 ක) අඩුවීම් වාර්තා විය.

අනෙකුත් කෘෂිකර්මාන්ත හා නිමැවුම් කර්මාන්ත අංශයන්හි පිළිවෙලින් සියයට 6·3 ක හා සියයට 2·3 ක වැඩිවීම් සටහන් විය. ගොඩනැගීම් හා වෙළෙඳ හා ප්‍රවාහන අංශවල සැලකිය යුතු වැඩිවීමක් දක්නට නො ලැබුණි.

1972 හා 1971 වර්ෂවල දී සියයට ගණනක් වශයෙන් විශාලතම සංඛ්‍යාවක් නියුතුව සිටියේ වෙළෙඳ හා ප්‍රවාහන අංශයෙහි ය. මෙම වර්ෂවල දී පිළිවෙලින් සියයට 45·7 ක් හා සියයට 46·2 ක් එම අංශවල නියුතුවිය. 1972 දී හා 1971 දී සේවා අංශයෙහි නියුතුව සිටි සංඛ්‍යාවන් පිළිවෙලින් සියයට 20 ක් හා සියයට 17 ක් පමණ විය. අපනයන කෘෂිකර්මාන්ත අංශයෙහි නියුතුව සිටි අනුරූප සංඛ්‍යාවන් මුළු සේවක සංඛ්‍යාවෙන් පිළිවෙලින් සියයට 8·5 ක් හා සියයට 9·5 ක් විය. 1971 දී හා 1972 දී අනෙකුත් කෘෂිකර්මාන්ත හා පතල් හා ගල් කැනීම් අංශවල නියුතුව සිටි සංඛ්‍යාවන් සමානුපාතික වශයෙන් සැලකිය යුතු නොවීය.

5. රැකියා සඳහා ලියාපදිංචි වූවන්

සේවා නියුක්තිය හෝ වඩා යහපත් සේවා නියුක්තිය සඳහා රැකීරක්ෂා කාර්යාලවල ලියාපදිංචිව සිටි සංඛ්‍යාව 1971 අවසානයේ දී 437,400 ක් වූ අතර, 1972 අවසානයේ දී 445,422 ක් විය. 1972 දී ශිල්පීය හා ලිපිකරු සේවාවන් සඳහා ලියාපදිංචි වූවන්ගේ සංඛ්‍යාව 7,140 කින් අඩු විය. 1971 දී මෙම අංශය සඳහා ලියාපදිංචි වූ සංඛ්‍යාව අඩු වූයේ 2,793 කිනි. පුහුණු සේවාවන් සඳහා 1972 දී 579 දෙනෙක් ලියාපදිංචි වූ අතර, එම සංඛ්‍යාව කලින් වර්ෂයේ ලියාපදිංචි වූ සංඛ්‍යාවට වඩා අඩු විය. නුපුහුණු සේවාවන් සඳහා 1971 දී හා 1972 දී දළ වශයෙන් පිළිවෙලින් 21,800 ක් හා 12,500 ක් ලියාපදිංචිව සිටියහ.

II (ඒ) 7 වන සංඛ්‍යා සටහන

දිවයිනේ රැකීරක්ෂා කාර්යාලවල වාර්තා අනුව සේවා නියුක්තිය හෝ වඩා හොඳ සේවා නියුක්තිය සඳහා ලියාපදිංචි වූවන්ගේ සංඛ්‍යාව

	කාලසීමාව අවසානයේ සංඛ්‍යා				
	ශිල්පීය සහ ලිපිකරු	පුහුණු	අර්ධ පුහුණු	නුපුහුණු	එකතුව
1970 දෙසැම්බර් ..	99,103	37,876	96,923	177,018	410,920
1971 මාර්තු ..	96,913	38,116	96,982	182 650	414,661
ජූනි ..	96,100	38,889	94,035	181,513	410,537
සැප්තැම්බර් ..	94,496	41,252	97,711	192,184	425,643
දෙසැම්බර් ..	96,310	42,655	99,520	198,915	437.400
1972 මාර්තු ..	91,530	42,890	100,393	204,461	439,274
ජූනි ..	91,223	42,949	99,861	201,199	435,232
සැප්තැම්බර් ..	91,114	43,378	100,374	206,943	441,809
දෙසැම්බර් ..	89,170	43,234	101,554	211,464	445,422

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව.

6. කම්කරු සම්බන්ධතා

1972 වර්ෂය තුළ පෞද්ගලික අංශයේ සිදු වූ වැඩ වර්ජන ගණන ඒවාට සහභාගි වූ සේවක සංඛ්‍යාව හා නැති වූ ශ්‍රම දින ගණන II (ඒ) 8 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

1971 වර්ෂය තුළ වතු අංශයෙහි වැඩ වර්ජන 125 ක් කර ඇති අතර, 1972 දී 164 ක් කර ඇත. වැඩ වර්ජනවලට සහභාගි වූ සේවක සංඛ්‍යාවෙහි ද වැඩිවීමක් වාර්තා විය.

1971 දී වැඩ වර්ජනවලට සහභාගි වූ සංඛ්‍යාව 50,847 ක් වූ අතර, 1972 දී 52,112 ක් සහභාගි වී ඇත. කෙසේ වුවද, නැති වූ ශ්‍රම දින ගණන 2,73,351 ක් දක්වා 180 කින් අඩු වී ඇත. 'වෙනත් රැකියා' ගණයේ 1972 දී පැවති වැඩ වර්ජන සංඛ්‍යාව 1971 වර්ෂයේදීට වඩා අඩු විය. වැඩ වර්ජනවලට සහභාගි වූ සේවක සංඛ්‍යාවෙහි හා නැති වූ ශ්‍රම දින ගණනෙහි ද සැලකිය යුතු පහත වැටීමක් ඇති විය. මේ අනුව, 1971 දී 39,955 ක් වූ වැඩ වර්ජනයන්ගේ සංඛ්‍යාව 1972 දී 2,205 දක්වා අඩු වූ අතර, නැති වූ ශ්‍රම දින ගණන 2,39,760 සිට 25,081 දක්වා අඩු විය.